# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2148/58 – 2019 නොවැම්බර් 09 වැනි සෙනසුරාදා – 2019.11.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/01/2018/221.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරිය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2019 අගෝස්තු මස 09 වැනි දින අංක 2135/66 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2019 අගෝස්තු මස 01 වැනි දින දරන නියෝගයෙන්,

ඊ. ජීවගන් මයා., මලිත් ස්ටාර් හවුස් ඇන්ඩ් ඉලෙක්ට්‍රිකල්ස්, අංක 61, සෙවනගල හන්දිය, සෙවනගල.

සහ

සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම, සෙවනගල.

අතර පවත්නා 2019 ජූලි මස 29 වන දින දරන කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිළිබඳව වූ කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් එස්. ජී. සූරියආරච්චි මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින්, කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර වන මම, එම නියෝගය අවලංගු කරන අතර, එකී 2019 අගෝස්තු මස 01 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

රවීන්ද්‍ර සමරවීර,
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2019 නොවැම්බර් මස 04 වැනි දින,
කොළඹ දී ය.

11 – 1508/1

1A – G 31441 – 26 (2019/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/01/2018/221.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4 (1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශවයක් වශයෙන්,*

ඊ. ජීවගන් මයා., මලිත් ස්ටාර් හවුස් ඇන්ඩ් ඉලෙක්ට්‍රිකල්ස්, අංක 61, සෙවනගල හන්දිය, සෙවනගල.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම, සෙවනගල.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මාලබේ, කහන්තොට, මල්වත්ත පාර, අංක 224/14 ඒ, කේ. ඒ. පියරත්න මයා. පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**රවීන්ද්‍ර සමරවීර,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2019 නොවැම්බර් මස 04 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/01/2018/221.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශවයක් වශයෙන්,*

ඊ. ජීවගන් මයා., මලිත් ස්ටාර් හවුස් ඇන්ඩ් ඉලෙක්ට්‍රිකල්ස්, අංක 61, සෙවනගල හන්දිය, සෙවනගල.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම, සෙවනගල.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''ලංකා සීනි (පුද්ගලික) සමාගමේ සේවය කළ ඊ. ජීවගන් මහතාට උසස්වීම් ලබා නොදීමෙන් හා එස් 3 ශ්‍රේණියේ වැටුප සඳහන් කොට එස් 4 ශ්‍රේණියේ වැටුප ලබා දීමෙන් අසාධාරණයක් සිදුව තිබේ ද? යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේ ද'' යන්නත් පිළිබඳව වේ.

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 ඔක්තෝබර් මස 23 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

11 – 1508/2

මගේ අංකය: IR/COM/04/2016/134.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4 (1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශවයක් වශයෙන්,*

1. ජී. ජී. එම්. කරුණාරත්න මිය., අංක 175/ඒ, රත්නාගොඩ, කනන්විල, අඟුරුවාතොට.
2. එල්. එල්. ඩී. ලියන්වල මිය., ගර්ටන් වත්ත, මාපුටුගල, පෝරුවදණ්ඩ.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ජනතා වතු සංවර්ධන මණ්ඩලය, අංක 55/75, වොක්ෂෝල් පටුමග, කොළඹ 02.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මහනුවර, ගුරුදෙනිය, කැඳවල - මඩිත්ත, අංක 286, එච්. එම්. අනුලාවතී මෙනෙවිය පත්කර ඇය වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**රවීන්ද්‍ර සමරවීර,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2019 නොවැම්බර් මස 04 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/04/2016/134.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශවයක් වශයෙන්,*

1. ජී. ජී. එම්. කරුණාරත්න මිය., අංක 175/ඒ, රත්නාගොඩ, කනන්විල, අඟුරුවාතොට.
2. එල්. එල්. ඩී. ලියන්වල මිය., ගර්ටන් වත්ත, මාපුටුගල, පෝරුවදණ්ඩ.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ජනතා වතු සංවර්ධන මණ්ඩලය, අංක 55/75, වොක්ෂෝල් පටුමග, කොළඹ 02.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

''ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ සේවය කරන ජී. ජී. එම්. කරුණාරත්න මිය. සහ එල්. එල්. ඩී. ලියන්වල මිය. යන දෙදෙනාහට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අනුව වැටුප් පරිවර්තනය කිරීමේදී අසාධාරණයක් සිදුවී තිබේ ද? එසේ අසාධාරණයක් සිදුවී තිබේ නම් ඔවුන්ට හිමිවිය යුතු සහනයන් කවරේ ද'' යන්න පිළිබඳව වේ.

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 ඔක්තෝබර් මස 04 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

11 – 1509

මගේ අංකය: IR/COM/03/2017/238.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2019 අගෝස්තු මස 05 වැනි දින අංක 2135/17 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2019 ජූලි මස 24 වැනි දින දරන නියෝගයෙන්,

පී. කේ. අජන්ත මයා., අංක 118/N/19, එගොඩ කනත්ත, බෝපේ, ගාල්ල.

සහ

දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය, අංක 19, පහළ ඩික්සන් පාර, ගාල්ල.

අතර පවත්නා 2019 ජූලි මස 01 වන දින දරන කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිළිබඳව වූ කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් එස්. ජී. සූරියආරච්චි මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින්, කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර වන මම, එම නියෝගය අවලංගු කරන අතර, එකී 2019 ජූලි ස 24 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**රවීන්ද්‍ර සමරවීර,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2019 නොවැම්බර් මස 04 වැනි දින,
කොළඹ දී ය.

11 – 1510/1

---

මගේ අංකය: IR/COM/03/2017/238.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4 (1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශවයක් වශයෙන්,*

පී. කේ. අජන්ත මයා., අංක 118/N/19, එගොඩ කනත්ත, බෝපේ, ගාල්ල.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය, අංක 19, පහළ ඩික්සන් පාර, ගාල්ල.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මත්තෙගොඩ, මද්‍රා උයන, අංක 149/102, කේ. කේ. කුමාරි ධනපාල මිය. පත්කර ඇය වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**රවීන්ද්‍ර සමරවීර,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2019 නොවැම්බර් මස 04 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/03/2017/238.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශවයක් වශයෙන්,*

පී. කේ. අජන්ත මයා., අංක 118/N/19, එගොඩ කනත්ත, බෝපේ, ගාල්ල.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය, අංක 19, පහළ ඩික්සන් පාර, ගාල්ල.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

''පී. කේ. අජන්ත යන අයගේ 2015.04.02 දිනට නියමිත වැටුප් වර්ධකය, සේවායෝජක වන දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් අත්හිටුවීම සහ හෝ විලම්භනය කිරීම යුක්ති සහගතද? එසේ නොවන්නේ නම්, හිමිවිය යුතු සහන කවරේ ද'' යන්න පිළිබඳව වේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 ඔක්තෝබර් මස 28 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

11 – 1510/2

---

මගේ අංකය: IR/COM/04/2018/194.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4 (1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශවයක් වශයෙන්,*

1. ආර්. මැණික්ගමආරච්චි මයා., අංක 410/17, කැලණිමුල්ල, මුල්ලේරියාව නව නගරය.
2. එම්. කේ. ඩී. මනෝජ් ගුණරුවන් මයා., අංක 21/7, සිද්ධමුල්ල, පිළියන්දල.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ගාලු පාර, රත්මලාන.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මාලබේ, කහන්තොට, මල්වත්ත පාර, අංක 224/14 A, කේ. ඒ. පියරත්න මයා. පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

රවීන්ද්‍ර සමරවීර,
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2019 නොවැම්බර් මස 04 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/04/2018/194.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශවයක් වශයෙන්,*

1. ආර්. මැණික්ගමආරච්චි මයා., අංක 410/17, කැලණිමුල්ල, මුල්ලේරියාව නව නගරය.
2. එම්. කේ. ඩී. මනෝජ් ගුණරුවන් මයා., අංක 21/7, සිද්ධමුල්ල, පිළියන්දල.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ගාලු පාර, රත්මලාන.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සේවය කරන ආර්. මැණික්ගමආරච්චි සහ එම්. කේ. ඩී. මනෝජ් ගුණරුවන් යන අයහට 2015.05.21 දින සිට ක්‍රියාත්මක වන පරිදි කළමනාකරු (මානව සම්පත්) තනතුරට ලබාදුන් උසස්වීම 2016.09.07 දින සිට ක්‍රියාත්මකවන පරිදි අවලංගු කිරීමෙන් එම සේවකයින් දෙදෙනාට අසාධාරණයක් සිදුව තිබේ ද? අසාධාරණයක් සිදුවී ඇත්නම් හිමිවිය යුතු සහන කවරේ ද'' යන්න පිළිබඳව වේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 ඔක්තෝබර් මස 22 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

11 – 1511

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.